මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :LAE/2025/69** **2025.04.25**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06
### නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම සම්බන්ධ කටයුතු **2025.04.16** දින තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී.

එසේම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාදීමේ විශේෂ දින ලෙස **2025.04.20** හා **2025.04.27** යන දිනවල දී බෙදාහැරීම් කටයුතු යොදා ඇති අතර, නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා අවසන් බෙදීම **2025.04.29** දින සිදු කෙරේ. **2025.04.29** දිනෙන් පසුව නිල ඡන්ද දැන්වීම් පත් නොලැබූ ඡන්ද හිමියන්ට 2024 පළාත් පාලන ආයතන ඡන්දහිමි නාමලේඛනයේ තමන් ලියාපදිංචි ලිපිනයට අදාළ තැපැල් කාර්යාලය වෙත ගොස් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව නිල ඡන්ද දැන්වීම්පත ලබා ගත හැකි බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිල ඡන්ද දැන්වීම්පත ඡන්ද පොළෙහි දී ඡන්දහිමියා හඳුනාගැනීමට පහසුවක් බව මැතිවරණ කොමිෂන් සභාව වැඩිදුරටත් නිවේදනය කර සිටී.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්